දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NCCP/ADM/29/2018
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 20. 03. 2018
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம், போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

---

පොදු චක්‍රලේඛ අංක: 01-14/2018

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,

සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ඇතුළු සියලු ආයතන ප්‍රධානීන් වෙත,

<u>රෝහල් සහ අනෙකුත් සෞඛ්‍ය ආයතනවල බුලත් විට සැපීම සහ බුලත් විට, දුම් කොළ සහ පුවක් සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන විකිණීම තහනම් කිරීම</u>

බුලත් විට සැපීම ශ්‍රී ලාංකික ජනතාව අතර පුරාතනයේ පටන් සමාජයීය සහ සංස්කෘතික වශයෙන් පිළිගත් පුරුද්දක් වශයෙන් පැවතුනු අතර එය එලෙසින් ම අද දක්වා පවතී. කෙසේ වෙතත්, දුම් කොළ සහිත ව හෝ රහිත ව බුලත් විට සැපීම සහ දුම් කොළ හා පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය මුඛ පිළිකා ඇති කිරීම සඳහා ප්‍රධාන අවදානම් සාධක බවට ප්‍රමාණවත් විද්‍යාත්මක සාක්ෂි ලැබී ඇත.

නාගරික ප්‍රජාව සමග සසඳන කල ශ්‍රී ලාංකීය ග්‍රාමීය ප්‍රජාව තුල බුලත් විට සැපීම බහුල ව දකින්නට හැකි ය. එසේ ම එය වැඩිහිටි ප්‍රජාව තුල වැඩි වශයෙන් ප්‍රචලිත ව ඇත. නමුත් වෙළඳ පොලේ ඇති සහ තමා විසින් ම සාදා ගත් දුම් රහිත දුම් කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය තරුණ ප්‍රජාව අතර වැඩි වීමේ ප්‍රවණතාවක් දකින්නට ඇත. ළමා අවධියේ දී ඇබ්බැහි වූ සෞඛ්‍යයට අහිතකර පුරුදු ජීවිතයේ වැඩි කාලයක් රඳා පවතින අතර එවැන්නන්ට එම පුරුදු වලින් මිදීම ද දුෂ්කර වේ. වර්ෂ 2015 දී ශ්‍රී ලංකාවේ සිදු කළ බෝ නොවන රෝගවලට අදාළ අවදානම් සාධක පිළිබඳ සමීක්ෂණයට (STEPS Survey) අනුව වයස අවු. 18 – 69 අතර වැඩිහිටි පිරිමි අතරින් 1/4කට වඩා (26 %) සහ ආසන්න වශයෙන් කාන්තාවන් අතරින් 5% පමණ වර්තමානයේ දුම් රහිත දුම් කොළ භාවිතා කරන බව වාර්තා වී ඇත. වර්ෂ 2003 දී සිදු කරන ලද ජාතික මුඛ සෞඛ්‍ය සමීක්ෂණයට අනුව, වයස අවුරුදු 34-44 අතර පුද්ගලයන්ගෙන් 34% ක් ද වයස අවුරුදු 65-74 අතර පුද්ගලයන්ගෙන් 47.7% ද බුලත් විට සැපීම සිදු කරනු ලැබේ.

තොල්, මුඛ කුහරය සහ මුඛ ග්‍රසනිකාවෙහි ඇති වන "මෞඛ අපිච්ඡද සෛල පිළිකාව" (squamous cell carcinoma) මුඛ පිළිකාව ලෙස සාමාන්‍යයෙන් හඳුන්වනු ලැබේ. 2010 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වාර්තා වූ නව පිළිකා රෝගීන් අතුරින් 14.3 % ක් තොල්, මුඛ කුහරය සහ මුඛ ග්‍රසනිකාව ආශ්‍රිත පිළිකා වන අතර එය පිරිමි අතර බහුල ම පිළිකා වර්ගය වේ. වර්ෂ 2010 දී පිරිමි අතර වාර්තා වූ නව පිළිකා රෝගීන් අතරින් 24 % ක් ම තොල්, මුඛ කුහරය සහ මුඛ ග්‍රසනිකාව ආශ්‍රිත පිළිකා රෝගීන් විය. මුඛ පිළිකා වැළඳීම සඳහා ප්‍රධාන අවදානම් සාධකය වීමට අමතරව බුලත් විට සැපීම මඟින් සෞඛ්‍යමය සහ රූප ලාවන්‍යයට අදාළ වෙනත් ගැටලු ඇති කරවනු ලැබේ. එ මගින් මුහුණේ ප්‍රසන්න පෙනීම නැති කරන තොල් සහ දිවේ සිදුවන පැලීම් සහ තුවාල, අකාලයේ දත් ගෙවීම, මුඛයේ සහ දත්වල සිදු වන දුර්වර්ණ වීම හඳුන්වා දිය හැකි ය. මෙම හේතූන් බුලත් විට සැපීමට ඇබ්බැහිවූවන්ගේ පෞරුෂය කෙරෙහි අහිත කර බලපෑම් ඇති කිරීමට ද හැකියාව ඇත. බුලත් විට සපා කෙළ ගැසීම පරිසරයේ අපිරිසිදුතාවයට හේතු වන අතර, එය ආයතනික පරිසරයේ පිරිසිදු බවට ද තර්ජනයකි.

එම නිසා 2017 නොවැම්බර් මස 24 වන දින රැස් වූ පිළිකා වැළැක්වීම සහ පාලනය පිළිබඳ උපදේශක කමිටු රැස්වීමේ දී සියලු රෝහල් සහ අනෙකුත් සෞඛ්‍ය ආයතන පරිශ්‍ර තුළ බුලත් විට සැපීම තහනම් කිරීමට තීරණය කෙරුණු අතර තවද බුලත් විට සහ අනෙකුත් විවිධ ආකාරයේ දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන එම ආයතන පරිශ්‍ර තුල විකිණීමට තහනම් කිරීමට ද තීරණය විය.

මේ අනුව සියලු ආයතන ප්‍රධානීන් තම ආයතන පරිශ්‍ර බුලත් විට සැපීම සහ විකිණීම සිදු නොවන පරිසර බවට සහතික විය යුතු ය. මෙම උපදෙස් වලට අනුගත නො වන්නා වූ සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින්ට එරෙහි ව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු ය. කවරකු හෝ බුලත් විට සැපීමට ඇබ්බැහි වීම නිසා එම පුරුද්දෙන් මිදීමට අපොහොසත් වේ නම් දන්ත වෛද්‍යවරයකු වෙත යොමු කල යුතු ය.

ශ්‍රීලංකාවේ පවතින මුඛ පිළිකා උවදුර සහ ඒ ආශ්‍රිත වෙනත් ගැටලු අඩු කර ගැනීමේ අරමුණ ඇති ව මෙයට පහසුකම් සැලසීමට සහ සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය සියලුම පියවර ගන්නා ලෙස සියලුම පළාත් සහ ප්‍රාදේශීය නිලධාරීන් වෙත උපදෙස් දෙනු ලැබේ.

මේ පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් කරුණාකර ජාතික පිළිකා මර්දන වැඩසටහනෙහි අධ්‍යක්ෂ හෝ එහි විශේෂඥ ප්‍රජා දන්ත වෛද්‍යවරයා හෝ අමතන්න (දුරකථන අංක: 0112368627).

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

පිටපත්:

ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය - කරුණාකර දැනගැනීම සඳහා

ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍ය - කරුණාකර දැනගැනීම සඳහා

සියලුම පළාත් සෞඛ්‍ය අමාත්‍යවරුන්

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

සියලු නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරු

අධ්‍යක්ෂක, ජාතික පිළිකා මර්දන වැඩසටහන

අධ්‍යක්ෂක, බෝ නොවන රෝග

අධ්‍යක්ෂක, දන්ත සේවා

අධ්‍යක්ෂක, මානසික සෞඛ්‍ය

අධ්‍යක්ෂක, ප්‍රාථමික සේවා

අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය

පළාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්, විශේෂඥ ප්‍රජා දන්ත වෛද්‍යවරු

ප්‍රධාන වෛද්‍ය නිලධාරි (පාසල් සෞඛ්‍ය)

සියලු ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්

සියලු වෛද්‍ය නිලධාරීන් (බෝ නොවන රෝග )

සියලු වෛද්‍ය නිලධාරීන් (මාතෘ හා ළමා සෞඛ්‍ය)